# සම්පිණ්ඩනය

**ලක්මිණි පහනින්** පුවත්පත් කලාවට අවතීර්ණ වූ කුමාරතුංගයන් විසින් පුවත්පත් කලාව සම්බන්ධයෙන් සුවිශද කළ නව්‍ය ලක්ෂණ, විප්ලවීය වෙනස්කම් සහ පූර්වාදර්ශ විමර්ශනයට ලක් කෙරෙන මේ පර්යේෂණ නිබන්ධය පරිච්ඡේද පහකින් සමන්විත ය.

පළමු වන පරිච්ඡේදයට සිංහල පුවත්පත්වල ප්‍රභවය සහ මුහුණුවර පිළිබඳ සංක්ෂිප්ත සාරගර්භ විස්තරයක් ඇතුළත් ය. සම කාලීන සමාජාර්ථික පරිසරයට අනුව ඒ ඒ පුවත්පත් අඩු වැඩි වශයෙන් ලාංකේය සමාජ අභිවෘද්ධියටත් සාහිත්‍ය ප්‍රබෝධයටත් පුවත්පත් කලාවේ ප්‍රගමනයටත් කරන ලද සම්ප්‍රදානය මෙහි දී විශේෂ අවධානයට යොමු කර ඇත.

කුමාරතුංගයන් පුවත්පත් කලාවට අවතීර්ණ වීමට පිටු දුන් දේශපාලන, ආර්ථික හා සමාජීය සාධක හඳුනා ගැනීම දෙ වන පරිච්ඡේදයෙහි අරමුණ යි. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී පාලනයෙන් ලාංකේය සමාජයට එල්ල වන තර්ජන හා ව්‍යසන අවබෝධ කර ගත් කුමාරතුංගයෝ පුළුල් ජනතාවාදී දෘෂ්ටියක පිහිටා සිටි පුවත්පත් කලාවේදියෙකි. දෙස බස රැස නො වහල් කර ගනු වස් පුවත්පත් කලාවේදියකු වශයෙන් ඉටු කළ භූමිකාව කෙබඳු දැ'යි යන්න මේ පරිච්ඡේදයේ දී ගැඹුරින් සාකච්ඡා කෙරිණි.

පූර්ව කාලීන හා පශ්චාත් කාලීන පුවත්පත් අතර සංවිධානාත්මක හා මනා සැකැස්මකින් එළි දක්වන ලද ලක්මිණි පහනෙහි අන්තර්ගතය විග්‍රහ කිරීමට තෙ වන පරිච්ඡේදය වෙන් කෙරිණි. දේශීය - විදේශීය ප්‍රවෘත්ති වාර්තා, විශේෂාංග, තීරු ලිපි සහ වෙළඳ දැන්වීම් ආදියෙන් යුත් එකී අන්තර්ගතය පුවත්පත් කලා මූලධර්මවලට කොතෙක් දුරට අනුකූල දැයි මේ පරිච්ඡේදයේ දී විමසිල්ලට බඳුන් කර ඇත.

සිව් වන පරිච්ඡේදය **ලක්මිණි පහන** පුවත්පතෙහි භාෂාව පිළිබඳ තුලනාත්මක විග්‍රහයකි. සිත් කා වදින සුලු සිරස්තල යෙදීම, ප්‍රවෘත්ති රචනය, අක්ෂර වින්‍යාසයෙහි හා පද බෙදීමේ නිරවද්‍යතාව, ව්‍යක්ත ප්‍රයෝග, සරල නිවැරදි වහර ආදි වශයෙන් ලක්මිණි පහනෙහි පුවත්පත් භාෂාව පිළිබඳ විචාරාත්මක විග්‍රහයක් මෙයට ඇතුළත් ය.

කුමාරතුංගයන් **ලක්මිණි පහතින්** කළ පුවත්පත් කලා විප්ලවය පශ්චාත් කාලීන පුවත්පත්වල ජීවමාන ව පවත්නා ආකාරය විමර්ශනය කිරීම පස් වන පරිච්ඡේදයෙහි අරමුණ යි. ඒ පුවත්පත පශ්චාත් කාලීන පුවත්පත්වලට ප්‍රදර්ශනය කළ පූර්වාදර්ශ සෝදාහරණ ව විමසිල්ලට ලක් කෙරෙන අතර ජනතාවාදී පුවත්පත් කලාව, ගවේෂණාත්මක වාර්තාකරණය නිර්මාණාත්මක සන්නිවේදන භාවිතය ආදි වශයෙන් **ලක්මිණි පහතින්** හඳුන්වා දුන් නව්‍ය ලක්ෂණ මේ පරිච්ඡේදයේ දී තුලනාත්මක විග්‍රහයකට ලක් කොට ඇත.